අප කාලයක් පුරාවට භාවිතා කරනා ඇතැම් යෙදුම් හා බැඳී ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්ප තිබෙනා බව බැහැර කළ නොහැකි කරුණකි. එවැනි යෙදුම් වර්තමාන භාවිතාවට යෝග්‍යදැයි යන්න පැනයකි.
ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් හැඳින්වීම සඳහා යෙදෙන දූෂණය යන වචනය මීට උදාහරණයක් ලෙස දැක්විය හැක. තවමත් නීති පොත් තුළ භාවිතා වුවත්, දූෂණය යන යෙදුම ඔස්සේ ගම්‍ය වන්නේ ඊට අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් වේ. ඒ හා බැඳී ගර්හාත්මක සමාජ ආකල්පය ඔස්සේ වින්දිතයාව කොන් කිරීමකට ලක් නොවන්නේදැයි අප විමසිය යුතු වේ. එම නිසා දූෂණය යන යෙදුම වෙනුවට ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ලිංගික අපයෝජනය/ ළමා ලිංගික අපයෝජනය වැනි යෙදුම් භාවිතය වඩාත් යෝග්‍ය වනු ඇත.
පහතින් දැක්වෙන්නේ බාලවයස් ලිංගික අපයෝජන සිදුවීමක් පුවත්පත් කිහිපයක් තුළ වාර්තා වී ඇති ආකාරයයි. එහිදී අරුණ, දිනමිණ, මව්බිම සහ දිවයින යන සියලුම පුවත්පත් සිරස්තල තුළ 'අපයෝජනය' යන යෙදුම භාවිතා වී ඇති අතර, ලංකාදීප සිරස්තලය තුළ පමණක් 'දූෂණය' යන යෙදුම භාවිතා වී ඇති ආකාරය නිරීක්ෂණය කල හැක.
#MediaEthicsSL #LK #SinhalaPress #SinhalaNews #Lankadeepa #Aruna #Dinamina #Mawbima #Divaina